# නිවේදනය

ගරු මන්ත්‍රීවරුනි,

ඊයේ උදෑසන සභා ගර්භයේදී ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය රීති ප්‍රශ්නයක් මතු කරමින් සභාවේ අවධානය යොමු කොට පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් සතියේ, එනම් 2021 ජුලි මස 20 වන දින බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතාට එරෙහි විශ්වාසභංග යෝජනාව පිළිබඳ විවාදය පැවති අවස්ථාවේදී ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමියට යම් වාචික ලිංගික හිංසනයක් සිදු වන ආකාරයට යම් ප්‍රකාශයක් සභාවේදී සිදු කරන ලද බවත්, ඒ අවස්ථාවේ දී මා මූලාසනය දරමින්, සිනාසෙමින් හා නිහඬව සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සාවද්‍ය ප්‍රකාශයක් වන අතර, මා එම අවස්ථාවේ දී මූලාසනය නොදරන ලද බව සභාවට දන්වනු කැමැත්තෙමි.

කරුණු නොසොයා සිදු කරනු ලබන මෙවැනි ප්‍රකාශයන්ගෙන් මූලාසනයට අගෞරවයක් වන බව එම මන්ත්‍රීතුමියට ම'විසින් දන්වනු ලබන අතර,

**ඉදිරියේදී සභාවේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට මීට වඩා වගකීමෙන් යුතුව කටයුතු කරන මෙන් දන්වනු කැමැත්තෙමි.**